JMC vLearning
"your virtual learning partner"

# ශ්‍රී ලංකාවේ නීතිය හා නෛතික රාමුව හැඳින්වීම

## AAT අදියර II

BLA - ව්‍යාපාර නීතිය


කපිල ජයසිංහ
LL.B (UOC), Post graduate diploma in Human rights law (IHR),
Attorney at Law



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# නීතිය හැඳින්වීම
# INTRODUCTION TO LAW

## නීතිය යනු කුමක්ද?

නීතිය යනු කුමක්ද යන්න පිළිබඳව විවිධ අර්ථකථන ඇත. සර් හෙන්රිමේන් නැමති නීතිවේදියා පවසා ඇත්තේ, නීතියේ ආරම්භය සිරිත බවයි. නීතිය යනු මිනිසාගේ ක්‍රියා කලාපය හසුරුවන රීති සමූහයක් බවට ද මතයක් ඇත. එසේම නීතිය යනු සමාජයේ වෙසෙනා පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් සමූහයක් වන අතර ඒවා කඩකලොත් යමෙක් ඒ මත වගකීම් වලට මුහුණ දීමට සිදුවේ යනුවෙන් මතයක් ඇත.

මේ නිර්වචන සියල්ලම එක්ව ගත් කළ **<u>නීතිය යනු ප්‍රජාවක් පාලනය කරන රීති සමූහයක්</u>** බවට පිඩුකොට දැක්විය හැක.

රටක නීති සාදන්නේ මහජන නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යවස්ථාදායකය විසින්, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවයි. මෙහි නියෝජිතයන් 225 දෙනෙකි. පාර්ලිමේන්තුවේ ප්‍රධානියා කථානායකවරයා ය. ඔහු රටේ තෙවැනි පුරවැසියාය. පාර්ලිමේන්තු ආණ්ඩුවේ ප්‍රධානියා අගමැතිවරයාය. විපක්ෂයට විපක්ෂ නායකවරයාය. පාර්ලිමේන්තුවට නියෝජිතයන් පත්කර ගන්නේ ජනතා ඡන්දයෙනි. මේ නිසා පාර්ලිමේන්තුව නීති සාදන විට මහජනතාව ද ඊට අනුමැතිය දුන්නාසේය. මේ නිසා නීතිය නොදැන සිටීම සමාවට කරුණක් නොවේ යන ප්‍රකට කියමනක් ඇත. කිසියම් නීතියක් පැනවීමට පෙර රජයේ ගැසට් පත්‍රයේ නීතිකෙටුම්පත පළ කරනු ලැබේ. මේ නිසා නීතිය පිළිබඳ අවබෝධයක් මහජනතාවට ඇතැයි නීතිය සලකයි. එම නීතියෙන්, පැනවීමට යන නීතියෙන් කිසියම් පුරවැසියෙකුට යම්කිසි අගතියක් සිදුවන්නේ යැයි සැලකෙන්නේ නම්, එම නීති කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ හැක. එයට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කළ පටන් සතියක් ඇතුලත කළයුතු බව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වගන්තියෙන් දැක්වේ.

ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසු නීතිකෙටුම්පතක් නීතියක් ලෙස සම්මත කිරීමට තවත් අවස්ථා 06 ක් පසු කරයි.

**01. පළමුවන වර කියවීම**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් යම් පනත් කෙටුම්පතක දීර්ඝ නාමය කියවනු ලැබීමෙන් පසු අදාළ විෂයභාර අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් විධිමත් දැනුම් දීමකින් පසුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ කියවීමයි.

**02. දෙවන කියවීම**

යම් පනත් කෙටුම්පතක් පළමුවර කියවීමෙන් සතියකට පසු දෙවැනි කියවීම සිදුවේ. මෙම අවස්ථාවේදී අදාළ පනත් කෙටුම්පතේ අදාළ ප්‍රතිපත්ති පිළිබඳව ජනතා නියෝජිතයන් අතර විවාදයක් පැවැත්වේ.

**03. කාරක සභා අවස්ථාව**

මෙහිදී කිසියම් පනත් කෙටුම්පතට පිළිබඳව විස්තර සහිතව සාකච්ඡා කෙරේ. එහි අරමුණු ප්‍රතිපත්ති එවැනි පනත් කෙටුම්පත් පිළිබඳව සලකා බලා ඒවා සංශෝධනය කිරීම, ඉවත් කිරීම හෝ එයට අලුතෙන් වගන්ති එකතු කිරීම මෙහිදී සිදුවේ. මෙම පියවරේදී යම් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ සහය ලබා ගැනීමට අවකාශ තිබේ.

**04. වාර්තා අදියර**


කාරක සභාව විසින් සංශෝධනය සිදු කළ පනත් කෙටුම්පත එම සංශෝධන සහිතව පාර්ලිමේන්තුවට වාර්තාවක් සැපයේ.

**05. තෙවැනි වර කියවීම**

අදාළ පනත් කෙටුම්පත ලිඛිතව හෝ වාචිකව සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ නම්, කිසියම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට විධිමත් දැනුම් දීමකින් පසුව එය සිදුකළ හැක. එම සංශෝධන සහිත පනත් කෙටුම්පත තුන්වන වර කියවීමෙන් පසු ඡන්දය විමසා සම්මත කෙරේ.

**06. කථානායකවරයාගේ සහතිකය**

එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට තුන්වන වර කියවීමෙන් පසු එය පාර්ලිමේන්තුව මගින් විධිමත් පරිදි සම්මත කරනු ලැබූ බවට සහතිකයක් සහිතව කථානායකවරයා එය අත්සන් කළ යුතුය. ඉන්පසුව එය නීතියක් බවට පත් වේ. කථානායකවරයාගේ සහතිකයක් නැතිව නීතියක් බිහි නොවේ.




## නීති (Laws) සහ රීති (Regulations / Rules) අතර වෙනස

නීති යනු, ව්‍යවස්ථාදායක විසින් පනවනු ලබන විශාල පිරිසකට (මුළු මහත් ප්‍රජාවටම) බලපාන රීති සමූහයකි. එහෙත් රීති යනු කුඩා පිරිසකට පමණක් බලපාන එම පිරිසට අදාළ ආයතනයක් හෝ පුද්ගලයකු විසින් පනවනු ලබන සීමාකාරී කොන්දේසි කිහිපයකි.

**උදා: ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදෙන රීති, ඒවා බලපාන්නේ ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදෙන ක්‍රීඩකයන්ට පමණි.**

ව්‍යවස්ථාදායකය විසින් සාදනු ලබන නීති ක්‍රියාත්මක කරනු ලබන්නේ විධායකය විසිනි. ශ්‍රී ලංකාවේ විධායකය අංග 03 කින් සමන්විත වේ.

1. ජනාධිපති
2. අමාත්‍ය මණ්ඩලය
3. රාජ්‍ය සේවය

මෙසේ විධායකය විසින් නීති ක්‍රියාත්මක කිරීමේදී කිසියම් පුද්ගලයකුට කිසියම් අසාධාරණයක් සිදුවන්නේ නම් එවිට ඕනෑම පුද්ගලයකුට අධිකරණයට යා හැකි අතර අධිකරණයක කාර්යයභාරය වන්නේ පවත්නා නීතියට අනුව යුක්තිය පසිඳලීමයි.

පරිච්ඡේදය 2

# නීති මූලාශ්‍ර
# SOURCES OF LAW

## නීති මූලාශ්‍ර යනු?

**නීති මූලාශ්‍ර යනු, අධිකරණයක් ඉදිරියට කිසියම් ගැටලුවක් ඉදිරිපත් වූ විට එම ගැටලුව හෝ ආරවුල විසඳීම සඳහා අවශ්‍ය නීතිය හෝ නීතිමය මූලධර්ම සොයා ගන්නා ක්‍රමවේදයයි.** මෙහිදී අධිකරණය මුලින්ම සැලකිල්ලට ගන්නේ, එම ගැටලුවට අදාළ කිසියම් ව්‍යවස්ථාවක් පනතක් පාර්ලිමේන්තුව විසින් පනවා ඇද්ද යන්නය. එසේ පනවා තිබේනම් එහි අඩංගු නීති මූලධර්ම මත අධිකරණය විසින් ගැටලුව විසඳනු ලැබේ. එවැනි පනතක් නොමැත්තේ නම්, හෝ පනතේ දක්වා ඇති නීතිය අධිකරණයේ හමුවේ තිබෙන ආරවුල සම්බන්ධයෙන් පැහැදිලිව අදාළ කරගත නොහැකි නම්, ඒවිට ඊළඟ මූලාශ්‍රය වන ඉහළ අධිකරණයන්හි නඩු තීන්දු වෙත යොමු වේ. එයින් ද පිළිසරණක් නොලැබෙන්නේ නම්, ඊළඟ නීති මූලාශ්‍රය වන සිරිත් වෙත යොමුවේ. අදාළ ආරවුල විසඳීම සඳහා යොදාගත හැකි සිරිතක් නොමැත්තේ නම්, අවසාන විකල්පය වන නීති වේදීන්ගේ මත වෙත යොමුවීමට අධිකරණයට සිදු වේ.

### (1) ව්‍යවස්ථා

ව්‍යවස්ථාව යනු, පනවන ලද නීතියයි. එනම් රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනෙකුත් සියලුම පනත් හා ආඥා පනත් මීට අයත් වේ.

**ආඥා පනත් (Ordinance) යනු, ශ්‍රී ලංකාව නිදහස ලැබීමට පෙර එංගලන්ත පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ හා මෙරට ව්‍යවස්ථාදායකය විසින් පනවනු ලැබූ පනත්ය.**

**පනත් (Acts) යනු,** නිදහසින් පසු මෙරට පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ නීති වේ.

රටක වැදගත්ම නීති මූලාශ්‍රය වන්නේ, එරට ව්‍යවස්ථාදායකය විසින් පනවනු ලැබූ අණපනත්ය. ඊට හේතුව පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සංකල්පය නිසා ආණ්ඩුවට තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑම පෙර අධිකරණ තීරණයක් සහ ඕනෑම සිරිතක් ඕනෑම ආකාරයකට අහෝසි කිරීම හෝ වෙනස් කිරීම සිදුකළ හැකි බැවිනි.

උදා ①: **1982 අංක 17 දරණ පැරණි සමාගම් පනත අහෝසි කරමින් 2007 අංක 07 දරණ සමාගම් පනත පැමිණීම.**

② **වර්ෂ 2000 දී පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂවල එකඟතාවයෙන් සම්මත කරනු ලැබූ 17 වන ආණ්ඩුක්‍රම සංශෝධනය 2010 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ 2/3 ඡන්දයෙන් අහෝසි කර 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම.**

### (2) ඉහළ අධිකරණයේ නඩු තීන්දු

මින් අදහස් වන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය විසින් දෙනු ලබන තීරණ වලින් පහළ අධිකරණය බැඳී සිටීමයි. මෙය අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය (Stare Decisis) අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය යන නම් වලින් හැඳින්වේ. මින් අදහස් වන්නේ මීට පෙර ඉහළ අධිකරණයක් විසින් දෙනු ලැබූ නඩු තීන්දුවට අනුව ඒ හා සමාන ගැටලුවකදී එකී පෙර තීරණය පදනම් කරගෙන අදාළ ගැටලුවකදී විසඳුමක් ලබාදීමයි. මෙසේ ඉහළ අධිකරණයක් විසින් දෙනු

ලබන නඩු තීන්දුවක් මගින් ඒ හා සමාන කරුණකදී පහළ උසාවිය එය යොදා ගැනීමට බැඳී සිටිනවා යැයි කීමෙන් අදහස් වන්නේ, ඉහළ අධිකරණයේ නඩු තීන්දුවේ හරය කෙරෙහි පමණක් බැඳී සිටීමයි. ඉහළ අධිකරණය විසින් කරනු ලබන ආගන්තුක ප්‍රකාශ කෙරෙහි පහළ උසාවිය නොබැඳේ.

උදා: **නීතිපති එදිරිව රිඩ් 67 NLR 25**

**නීතිපති එදිරිව රිඩ්** රාජාධිකරණය තීරණය කළේ කිසියම් පුද්ගලයකු සිය ආගම වෙනස් කිරීම මගින් දෙවැනි විවාහයට ඇතුලත් වීම මගින් බහු භාර්යයා සේවනයේ යෙදීම නීත්‍යානුකූල බවයි. එහෙත් මෙය **නටාලියා අබේසුන්දර එරෙහිව ක්‍රිස්ටෝපර් අබේසුන්දර** නැමති 1995 දී තීන්දු වූ නඩුවකදී වෙනස් විය. එහිදී අධිකරණය තීරණය කළේ සාමාන්‍ය විවාහ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකරනු ලැබූ පළමු විවාහය විසුරුවා හැරිය යුත්තේ ද එම පනත අනුවම බවත් පළමු විවාහය වලංගුව තිබියදී ආගම වෙනස් කර සිදුකර ගත් දෙවැනි විවාහය නීති විරෝධි වන බවත්, අදාළ පුද්ගලයා ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 362 B වගන්තිය යටතේ විස්තර කෙරෙන ද්වි විවාහය නැමති වරදට වරදකරුවා වන බවත්ය.

## (3) සිරිත්

කිසියම් සිරිතක් අධිකරණය විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාවයන් කිහිපයක් සම්පූර්ණ කළ යුතුය.

**(i) ඉපැරණි නීති**

රෝම ලන්දේසි නීතියට අනුව එම සිරිත වර්තමානයේ ජීවත්වන පරම්පරාවට වඩා පැරණි විය යුතුය. නමුත් ඉංග්‍රීසි නීතියට අනුව එම සිරිත ක්‍රි.ව. 1889 සිට පැවත ආ එකක් විය යුතුය.

**(ii) නිශ්චිත වීම**

එම සිරිතේ ස්වභාවය කුමක්ද යන්න නිශ්චිතවම සාක්ෂි මගින් ඔප්පු කළ යුතුය. ඒ අනුව එම සිරිත පැවති කාලය, බල පැවැත්වූ ප්‍රදේශය සහ ජන කොට්ඨාශය පැහැදිලිවම හඳුනා ගත යුතුය.

**(iii) සාධාරණ සිරිතක් විය යුතුය**

එනම් මෙම සිරිත මගින් කිසියම් පුද්ගල කණ්ඩායමකට හෝ ජන සමාජයකට අසාධාරණයක් සිදු නොවිය යුතුය.

**(iv) පවත්නා නීතියට පටහැනි නොවිය යුතුය**

එනම් රටේ පනවා ඇති ව්‍යවස්ථා හා පොදු නීතිරීති වලට අදාළ සිරිත අනුකූල විය යුතුය.

**(v) සිරිත අයිතිවාසිකමක් ලෙස පිළිපැද තිබිය යුතුය**

මෙහි අදහස යම් පුද්ගල කොට්ඨාශයක් විසින් කිසිම බලහත්කාරයෙන් හෝ තවත් කෙනෙකුගෙන් අදහසකින් තොරව පිළිපැදිය යුතු වේ. කිසියම් සිරිතක් නීතිගත කළ යුත්තේ එම යම්කිසි පුද්ගල කොට්ඨාශයක් විසින් පොදුවේ පිළගන්නේ එය පමණි.

**(vi) නීතිවේදීන්ගේ මත**

ඉහත කී මූලාශ්‍ර 03 මගින් විසඳාගත නොහැකි ගැටලුවක් අධිකරණය හමුවේ පවතින විට ප්‍රකට නීතිවේදීන් විසින් ලියන ලද නීති ග්‍රන්ථ වල ඇති මත අධිකරණය විසින් සැලකිල්ලට ගනී. මෙරට පොදු නීතීය රෝම ලන්දේසි නීතිය වන නිසා ප්‍රකට රෝම ලන්දේසි නීතිවේදීන් ලෙස සැලකෙන ෆූට් (Voet) සහ හියුගෝ ග්‍රෝෂස් (Gratius) යන නීතිවේදීන් විසින් ලියන ලද ග්‍රන්ථ මෙරට අධිකරණය විසින් නිරතුරුවම භාවිත කරයි.

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය හා නීති ඉතිහාසය
# LEGAL SYSTEM & HISTORY OF SRI LANKA

පරිච්ඡේදය 3

(1) **රාජාණ්ඩු සමය**
(2) **පෘතුග්‍රීසි යුගය**
(3) **ලන්දේසි**
(4) **ඉංග්‍රීසි යුගය**

**රාජාණ්ඩු සමය**

විදේශ ජාතීන් මෙරටට පැමිණීමට පෙර මෙරට පැවතියේ රාජාණ්ඩු පාලන ක්‍රමයකි. එම යුගයේ පාලන ක්‍රමය හා නීතිය පිළිබඳ විස්තර කෙරෙන "නීති නිඝණ්ඩුව" නැමති කෘතියේ දක්වෙන ආකාරයට රජු ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ බලතල යන බලතල 03 ම දරණ ලදී. පරිපාලනය පහසුව සඳහා රජු යටතේ අධිකාරම්වරු (ඇමතිවරු), නිලමේවරු, ගම්පතීන් ප්‍රාදේශීය වශයෙන් සිටි අතර ඔවුන් කෝරලේවරුන් ලෙස ද හඳුන්වන ලදී. රාජාණ්ඩු සමයේ නීතිය වරදකරුවන්ට දැඩි දඬුවම් පමුණුවන සෘජු ප්‍රතිපත්තිමත පිහිටා කටයුතු කළ එකක් වීම මේ නිසා දැඩි විනයක් එවකට සමාජයේ තිබූ බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ.

රාජාණ්ඩු සමයේ නීති මූලාශ්‍ර,

(i) රාජ ආඥා
(ii) දසරාජ ධර්මය
(iii) ප්‍රාදේශීය සිරිත් ක්‍රියාත්මක වීම

**පෘතුගීසි යුගය - ක්‍රි.ව. 1505 සිට 1654 දක්වා -** මෙරට නීති ක්‍රමයට බලපෑමක් ඇති නොවීය.

**ලන්දේසි යුගය - ක්‍රි.ව. 1654 සිට 1796 දක්වා -** රෝම ලන්දේසි නීතිය මෙරටට හඳුන්වා දෙන ලදී.

රෝමලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය ලෙස සැලකෙන අතර, එමගින් පහත දැක්වෙන නීති ක්ෂේත්‍ර පාලනය වේ.

1. **දිලික්ත නීතිය (සිවිල් වැරදි පිළිබඳ නීතිය)**
   උදා: රිය අනතුරු වන්දි නඩු, වෘත්තීයමය නොසැලකිල්ල පිළිබඳ නඩු
2. **දේපළ නීතිය**
3. **ගිවිසුම් නීතිය**
4. **පවුල් නීතිය**

**ඉංග්‍රීසි යුගය - ක්‍රි.ව. 1798 සිට 1948 දක්වා -** ඉංග්‍රීසි නීතිය මෙරටට හඳුන්වා දෙන ලදී.

මෙහි බලපෑමක් ඇති නීති ක්ෂේත්‍ර
1. ව්‍යවස්ථා නීතිය
2. අපරාධ නීතිය
3. අපරාධ නඩු විධාන නීතිය
4. සාක්ෂි නීතිය
5. පරිපාලන නීතිය

**ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති**

**1. උඩරට නීතිය**
උඩරට පළාත් වල උපන් වැසියන්ට බලපාන එම පළාතට බලපාන නීතිය.

**2. තේසවලමේ නීතිය**
ද්‍රවිඩ බස කතා කරන මලබාර් වැසියන්ට බලපාන යාපන පළාතේ ක්‍රියාත්මක නීතිය.

**3. මුස්ලිම් නීතිය**
ශ්‍රී ලංකාවේ කවර තැනක වාසය කළත් මුස්ලිම්වරුන්ට බලපාන නීතිය.

පරිච්ඡේදය 4

# නීතියේ ශාඛා
# BRANCHES OF LAW

**නීතියේ ශාඛා**

- සිවිල් නීතිය Civil Law
- අපරාධ නීතිය Criminal Law

## සිවිල් නීතිය

(1) කිසියම් තැනැත්තෙකුට මූල්‍යමය පාඩුවක් කරන විට එය සිවිල් නඩුවක් වේ. එක් පුද්ගලයෙකු විසින් අනෙක් පුද්ගලයකුට බැඳෙන පෞද්ගලික යුතුකම් හා සම්බන්ධ වේ.

උදා:

(i) **ගිවිසුම් කඩකිරීම සම්බන්ධ නඩු**
මෙවැන්නක ලිඛිත ගිවිසුම කඩවී වසර 06 ක් හා වාචික ගිවිසුමක් නම් වසර 03 ක් ඉකුත් වීමට පෙර පැවරිය යුතුය.

(ii) **ඉඩම් නඩු හා බෙදුම් නඩු**
මෙවැනි නඩුවක් නිශ්චල දේපළක් හා සම්බන්ධ වීම නිසා නඩු නිමිත්ත ඇති වී අවුරුදු 10 ඇතුලත පැවරිය යුතුය.

(iii) **පවුල් ආරවුල් සම්බන්ධ නඩු**
දික්කසාද, දරුවන්ගේ භාරකාරත්වය, විවාහ ශූන්‍යතා.

(iv) **බැංකු රක්‍ෂණ නඩු**

(v) **වන්දි නඩු**
මේ යටතට පාඩු අලාභ අනතුරු සම්බන්ධ නඩු ඇතුලත් වේ. ඒහා සම්බන්ධ නඩු වසර 02 ක් ඉකුත්වීමට පෙර පැවරිය යුතුය.

(vi) **මූලික අයිතිවාසිකම් නඩු**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 10 - 14 දක්වා මූලික අයිතිවාසිකම් හෝ භාෂා අයිතිවාසිකමක් කඩවීමක් හෝ කඩවීමට ආසන්න අවස්ථාවක දී එතැන්පටන් මාසයක් ඇතුලත ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීම.

(2) සිවිල් නීතියේ අරමුණ වන්නේ, වරද කළ අයට දඬුවම් කිරීම නොව අලාභය පියවීමයි. (හානි පූර්ණය)

(3) සිවිල් නඩුවක් පවරන්නේ සිවිල් අධිකරණයකයි.
උදා: **දිසා අධිකරණය**

(4) සිවිල් නඩුවක් පනවන අය පැමිණිලිකරු ලෙසත්, නඩුව පැවරිය යුත්තේ යමෙකුට එරෙහිවද ඔහු විත්තිකරුය.

(5) සිවිල් නඩුවක් අදාළ පාර්ශවකරු විසින් පැවරිය යුතුය.

(6) අතෘප්තියට පත් පාර්ශවයට වන්දි ගෙවීමට හෝ ගිවිසුමක් නම්, එසේම ඉටු කිරීමට ඉල්ලා සිටිය හැකිය.

(7) සිවිල් නඩුවක කාර්යය පටිපාටිය

(i) පැමිණිලිකරුවන් විසින් තමාට වූ පාඩුව පිළිබඳව එන්තරවාසියක් යැවීම. එම එන්තරවාසියේ අලාභය හෝ එහි කොටසක් හෝ දින 14 ක් ඇතුලත නොගෙවන්නේ නම්, නඩු පවරන බව දැන්වීම.

(ii) එන්තරවාසියට පිළිතුරු ලැබුණත්, නොලැබුණත් දිසාඅධිකරණයේ පැමිණිලිකරු විසින් නීතිඥයකු මාර්ගයෙන් නඩුවක් පැවරීම

(iii) අධිකරණය විසින් ලියාපදිංචි තැපැල මගින් හෝ පිස්කල් මගින් සිතාසි භාරදීම. මෙහිදී විත්තිකරු සිතාසි භාර නොගන්නේ නම්, ඔහු එම ලිපිනයේම පදිංචි බවට අධිකරණය සෑහිමකට පත්වේ නම්, අදාළ සිතාසිය අදාළ විත්තිකරුගේ නිවසේ දොරේ අලවා භාරදීම සිදු කරනු ලැබේ. (ආදේශ ක්‍රමයට භාරදීම)

(iv) එසේ භාරදුන් පසු විත්තිකරු අධිකරණයට පැමිණ නීතිඥයකු මගින් පෙරකලාසියක් (Proxy) හෙවත් තමා වෙනුවෙන් නඩුවේ කටයුතු කරගෙන යාමට හෝ පෙනී සිටීමට නීතිඥවරයාට බලය දෙන ලියවිල්ල සහ උත්තරය ගොනු කළ යුතුය. එසේ දිසා අධිකරණයට විත්තිකරු නොපැමිණියහොත් ඒකපාර්ශවිකව නඩුව විභාග කරනු ලැබේ.

(v) උත්තරයක් ගොනු කළේ නම්, එහි හරස් ඉල්ලීමක් තිබේනම්, පැමිණිල්ලට ප්‍රති උත්තරයක් ගොනු කිරීමට අවස්ථාවක් තිබීම.

(vi) ප්‍රති උත්තරයක් ගොනු කළ පසු නඩුව විභාගයට ගනී. නඩු විභාගයට දින 15 ට පෙර දෙපාර්ශවයේම ලේඛන හා සාක්ෂි ලැයිස්තුව අධිකරණයට ගොනු කළ යුතුය.

(vii) දෙපාර්ශවයේම විසඳිය යුතු ප්‍රශ්න සහ පිළිගැනීම, වාර්තා කිරීම, දෙපාර්ශවයේම සාක්ෂි විමසීම (නඩු විභාගය)

(viii) දෙපාර්ශවයේම ලිඛිත ලේඛන ගොනු කිරීම.

(ix) නඩු තීන්දුව ලබා දීම.

(x) ජය ලැබූ පාර්ශවය විසින් තීන්දු ප්‍රකාශය ගොනු කිරීම.

(xi) විත්තිකරු අලාභය නොගෙවන්නේ නම්, දේපළ තහනමට ගෙන අලාභය අය කරවා ගැනීම.

## අපරාධ නීතිය

(1) සමාජයට එරෙහිව කරන වැරදි සම්බන්ධයෙන් අදාළ වේ. සාමාන්‍යයෙන් අපරාධ නඩු පැවරීම කරන්නේ රජයේ ආයතනයක් විසිනි.
**උදා: පොලිසිය, වංචා විමර්ශන අංශය**

අපරාධ නීතිය යටතට ගැනෙන වැරදි, උදා:
- මිනී මැරුම්
- රාජද්‍රෝහිවීම්

- ස්ත්‍රී දූෂණ
- මංකොල්ල කෑම්
- සොරකම්
- අනර්ථය සිදු කිරීම
- බරපතල තුවාල සිදුකිරීම
- වංචා කිරීම් වැනි වැරදි

මේවා අතුරින් රාජද්‍රෝහි වීම හා මිනිමැරුම් හැර සෙසු සියලු වැරදි සඳහා එම අපරාධය සිදු වී වසර 20 ඇතුලත නඩුව පැවරිය යුතුය.

(2) අපරාධ නීතියේ අරමුණ වන්නේ, වරද කළ අයට දඬුවම් දීම මිස එම අයට අලාභය පියවීම නොවේ.

(3) අපරාධ නඩුවක් පැවරිය යුත්තේ සුළු අපරාධ සම්බන්ධයෙන්, අදාළ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයේ හා බරපතල අපරාධ සම්බන්ධයෙන්, මහාධිකරණයේ නඩුව පැවරිය යුතුය.

(4) අපාධ නඩුව පවරන අය අභිචෝදක ලෙසත් එවැනි පවරන අයෙකුට එරෙහිව ඔහු සැකකරු ලෙස.

(5) අපරාධ නඩුවක් රජයේ ආයතනයක් විසින් පවරනු ලැබේ. එහෙත් සමහර අවස්ථා වලදී පෞද්ගලික නඩු ලෙස ද මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතුය.

(6) දඬුවම් වශයෙන් වැරදිකරුට දඩයක් නියම කිරීම, සිර දඬුවම් නියම කිරීම හෝ මරණීය දණ්ඩනය නියම කළ හැක.

(7) අපරාධ නඩුවක කාර්යපටිපාටිය.
- (i) සිදු වූ අපරාධය සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.
- (ii) සැකකරු අත්අඩංගුවට ගැනීම.
- (iii) සාමාන්‍ය නීතිය යටතේ චෝදනාවක් නම්,
  සැකකරුව පැය 24 ක් ඇතුලත මහේස්ත්‍රාත්වරයකු හමුවට ද, මෑතකදී සම්මත වූ බරපතල වැරදි සම්බන්ධයෙන් පැය 48 ක්ද, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (1979 අංක 48 දරණ) යටතේ නම් පැය 72 ඇතුලත ද මහේස්ත්‍රාත් හමුවට සැකකරුවාව ඉදිරිපත් කිරීම කළ යුතුය. එවිට ද ප්‍රශ්න කිරීමට කාලය මදිනම්, ආරක්‍ෂක ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව සැකකරුව මාස 03 ක් රඳවා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කළ යුතුය.
- (iv) චූදිතයව මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කළේ නම්, B වාර්තාව මගින් පොලීසිය අධිකරණයට කරුණු දක්වයි. ඇපදිය හැකි වරදක් නම්, ඇප ලබාදීම ඊට අදාළ වැඩිදුර වාර්තාව A වාර්තාව ලෙසද හැඳින්වේ.
- (v) විදිමත් චෝදනා සහිත පැමිණිල්ලක් ගොනු කිරීම.
- (vi) සාක්ෂි විමසීම (නඩු විභාගය)
- (vii) වාචික ලේඛන හා ලිඛිත දේශන දෙපාර්ශවය විසින් ඉදිරිපත් කිරීම.
- (viii) නඩු තීන්දුව ලබා දීම.
- (ix) සැකකරු වරදකරු වුයේ නම් දඬුවම් නියම කිරීම.